# අභිරහස් චාරිකාව



කේ. එස්. එවින්දි උමලි මනම්පේරි

# අභිරහස් චාරිකාව

එවින්දි  උමලි අයත්මා මනංජේරි

පාසල - මහමායා බාලිකා විද්‍යාලය

8 ශ්‍රේණිය B

වෙනත් කෘති -

- අපූරු සෙල්ලම
- සුරංගනා ලෝකය
- නත්තල් සීයා

කෘතිය පළ කරන දිනය - 2025 පෙබරවාරි 8

ISBN 978-624-208-648-4

# පිදුම

පුංචි කාලේ සිටම ආදරයෙන් හැදූ වැඩූ මාගේ ආදරණීය අම්මාටත් අප්පච්චීටත් හා මට අකුරු උගැන්වූ සියලුම ගුරු මහත්ම මහත්මීන්ටත් ස්තූතිය පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යම වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීතයතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ට කරණයට යොමු කරන " හෙරණ ගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම

පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගතදිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධිර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

පාසලේ ග්‍රීෂ්ම නිවාඩුව ඇරඹීමට තව ඇත්තේ දවස් තුනකි. මා නොයිවසිල්ලෙන් බලා සිටින්නේ පාසල් නිවාඩුව ඇරඹෙන තුරුයි. මා සහ මගේ මිතුරන් මෙවර නිවාඩුව ගත කිරීමට තෝරා ගත්තේ මගේ ආච්චි අම්මාගේ නිවසයි. අද බදාදායි. මම සුපුරුදු පරිදිම පාසල් යෑමට අවදි වුණෙමි. මූණ කට සෝදා පහළට ගියේ උදෑසන ආහාරය ලබා ගැනීමටයි. අම්මා කිරි වීදුරුව ගෙනැවිත් මේසය උඩින් තැබුවාය. ‘‘සුභ උදෑසනක් අම්මා, සුභ උදෑසනක් තාත්තා.’’ මම කීවෙමි. තාත්තා නම් එවිට පත්තරය බලමින් සිටියේය.

‘‘බැංකුවක් මංකොල්ල කෑ හොරුන් තිදෙනෙක් අත් අඩංගුවට.’’ තාත්තා පත්තරය දෙස බලමින්ම කිව්වේය. ‘‘දැන් හරි හරියට රටේ ලෝකේ සොරකම් වෙනවා. පෙරේදා මැගී නැන්දලාගේ ගෙදරටත් හොරු පැනලා. මුකුත් අරන් ගිහින් නම් නෑ. ඒත් මැගී නැන්දාගේ දුව බය වෙලා හොඳටම කෑගහලා, ඒ සද්දෙට කොහොමහරි හොරු ටික පැනගෙන’’ අම්මා එලෙස කියාගෙන ආලින්දයට ආවාය.

මම මගේ බෑගයත් රැගෙන අම්මට හා තාත්තාට සමුදී එළියට බැස්සෙමි පාසල් බස් රථය ඒමට පරක්කු වන නිසා මම හෙමිහිට ඇවිදගෙන ගියෙමි. මා බස් නැවතුම්පොළට යනවත් සමගම මගේ හොඳම යාළුවා වන පීටර්ද එතනට පැමිණියේ ''සුභ උදෑසනක්'' කියා කියමින්ය මම එයට සිනහවකින් ප්‍රතිචාර දුන්නෙමි.

''ඇත්තටම මේ පාර නිවාඩුවට හොඳට විනෝද වෙන්න පුළුවන්.'' ඒ කිව්වේ පීටර්ය.

ඔව් ''එහේ ඔරු පදින්නත් පුළුවන් කියලා මගේ ආච්චි අම්මා කිව්වා.'' ඒත් එක්කම මගේ පාසල් බස් රථය පැමිණ නවත්තන ලදී. අපි දෙදෙනාම බස් රථයට ගොඩ වී දෙදෙනෙකුට අසුන් ගත හැකි අසුනක ඉඳගත්තෙමු. වැඩිවෙලා යාමට පෙර අපි පාසලට ළඟාවුණෙමු. මායි පීටරුයි බස් රථයෙන් බැස්සේ අනෙක් යාළුවන් තිදෙනාද හමුවීමට සිතාගෙනය. ''ඔයාලා භූගෝල සිතියම් ලකුණු කරාද?'' ඒ කියාගෙන ආවේ ජෝන්ය. අපි එයට ඔව් කියා පිළිතුරු ලබා දුන්නෙමු.

ඉන්පසු අපි තිදෙනාම පංතියට ගොස් අනෙක් යාළුවන් දෙදෙනා වන ජැක් හා ඇලිසන් සමග දීර්ඝ කතාවකට මුල පිරුවෙමු. මුළු පන්තියම දැන් ඝෝෂාකාරිය. පළමු වන කාලච්ඡේදය භූගෝලයය. නමුත් භූගෝල ගුරුතුමිය වන මිස් එලීස් සෑමදාම පංතියට පැමිණෙන්නේ විනාඩි දහයක් පරක්කු වෙලාය. නමුත් පංතිය නිශ්ශබ්ද වීමට වැඩි වේලාවක් ගියේ නැත. මිස් එලීස් එකපාරටම පංතියට කඩාගෙන පාත්වුණාය. භූගෝල පාඩම හරිම ඒකාකාරිය. භූගෝල ගුරුතුමිය එක දවසට විශාල පිටු ප්‍රමාණයක් උගන්වයි භූගෝල කාලච්ඡේදයේදී පංතියෙන් භාගෙට භාගයක්ම ළමයි නිදි කිරා වැටෙති. සමහරුන් වෙනත් වැඩවල නිරත වෙති. කෙසේ හෝ විනාඩි හතළිහකින් පසුව භූගෝල ගුරුතුමිය යන්නට සැරසුණාය. ළමයින්ට නම් ඉහේ මල් පිපුණාක් මෙනි. ඔවුහු හරිම උද්යෝගයෙන් නැගිට මිස් එලීස්ට ආයුබෝවන් කිව්වෝය.

ඊළඟ **කාලපරිච්ඡේදය** අපටඅපේ විවේක කාලච්ඡේදයයි. ඉතින් මම සහ මගේ යහළුවන් කැන්ටිමට ගියේ දිවා ආහාරය ලබා ගැනීමටයි. මේ වෙලාවට මෙතැන විසිරුණු කූඹි ගුලක් වගේ, ඇඟිල්ලක් ගහන්නවත් ඉඩ නැති තරම්. එච්චරකට ළමයි පිරිලා. අපි ඉක්මනට ආපු නිසා කෑම ගන්න වැඩි වේලා ගියේ නැත. ඒ වගේම අපි ඉක්මනට ඉඩක් අල්ල ගත්තෙමු. මොකද තව ටික වෙලාවකින් මෙතැන ඉඳගන්න තියා හිටන් ඉන්නවත් ඉඩ නැති වෙන නිසාය. අපට විවේක කාලය තියෙන්නේ විනාඩි 30ක් විතරයි. අපි ඉක්මනට කෑම ගෙන ආපසු පංතියට ගියෙමු. ඊළඟට තිබෙන්නේ ඉතිහාසය කාලච්ඡේදයයි. ඉතිහාසය කාලච්ඡේදය නම් භූගෝල කාලච්ඡේදය තරම් නරක නැත. ඉතිහාස මිස් උගන්නනකොට එක ළමයෙක්ටවත් කතා කරන්න තියා හූම් සද්දයක්වත් ඇහෙන්න බෑ. ඒ නිසා පංතිය නිකං මීයට පිම්බාක් මෙනි. අපිට එදා ඉතිහාසයේ ඉගෙන ගන්න තිබුණේ ග්‍රීක ශිෂ්ටාචාරය ගැන. ඉතින් කොහොමහරි තව විනාඩි 30කින් පස්සේ ඒ කාලච්ඡේදයත් ඉවර වෙන ලදී.

මෙච්චර වෙලා නිශ්ශබ්දව තිබ්බ පංතිය දැන් මාළු කඩයක් වගේ. කොහොම වුණත් හෙට තමයි මේ අවුරුද්දේ ඉස්කෝලෙ එන අවසාන දවස. මොකද ඊට පස්සේ අපිට නිවාඩු. ඉතින් හැම ළමයෙක්ම වගේ නොවරදවාම හෙට ඉස්කෝලේ එනවා. ඉස්කෝලේ අවසාන දවස කියන්නේ ළමයින්ට හරි නිදහස් දවසක්. ගොඩාක් වෙලාවට මේ දවසට ගුරුවරු උගන්වන්නේ නැති හින්දා ළමයි හිතේ හැටියට විනෝද වෙනවා. ඉතින් හෙට මුළු පංතියේම පාටි එකක් තියෙනවා. මොකද හෙටනේ ඉතින් අවසාන දවස. පංතියේ ඉන්න පොත් ගුල්ලෝ ටිකටනම් ගානක්වත් නෑ. පාසල අවසන් වෙන සීනුව නාද වුණා. හැම ළමයෙක්ම වගේ ගෙදර ගියේ හිතේකුල්මත් ප්‍රීතියක් තියාගෙනයි. මායි මගේ යාළුවොත් එකිනෙකාට සමුදුන්නේ හෙට ආපසු හමුවන බව සිහිකරමිනි. හැමෝම හෙට වෙනදාට වඩා උදෙන්ම පාසලට එති. මොකද පංතිය සරසන්න ඕන නිසා. මම හෙට දවස ගැන සිතමින්ම පාසල් බස් රථයට ගොඩ වුණෙමි.

සැම ළමයෙක්ම එදින ප්‍රීතියෙන් ගත කළහ. සියලු දෙනාම සිංදු කියමින් නටමින් ප්‍රීති වූහ.

අපේ අනිත් බලාපොරොත්තුව වූයේ චාරිකාවයි. අපි පසුදිනම එහි යෑමට සැරසුනෙමු. දුම්රියෙන් ගිය ගමන අපගේ නෙත් ඇද බැද අල්ලා ගෙන සිටියේ ඒ අවට පරිසරයටයි. ඒ දෙපස වගා කර තිබූ තිරිඟු යායක් දක්නට ලැබුණි. අවසානයේ අපි ආච්චි අම්මාගේ ගෙදරට පිය නැගුවෙමු. එය පරණ කාලේ ගෙයකි. සීයා නම් ගෙදර පෙනෙන්නට සිටියේ නැත්තේ ඒ ඔහු ගොවිපොළට යන නිසා විය යුතුයි. ආච්චි අම්මා අපව සාදරයෙන් පිළිගත්තාය. අප එන විටත් ආච්චි අම්මා තේ මේසයක් පිළියෙළ කර තිබුණි. සැවොම මහන්සියෙන් සිටිය නිසා අපි තේ පානය කර කේක්ද කෑවෙමු. ඉන්පසු අපේ කාමරවලට ගියේ ඇගේ තිබූ මහන්සිය නිවා ගැනීමටය. මම හා ජැක් සිටියේ එක කාමරයකය. ඇලෙක්ස් සහ පීටර් හිටියේ අනිත් කාමරයේය.

විවරව තිබූ ජනෙල් පියන් වලින් සීත සුළං කාමරය තුළට ගලාගෙන එන ලදී. ජනේලයෙන් එළිය බැලූ විට පෙනුනේ රළ හඩ නගන මුහුදයි. ඉන්පසු අපි රාත්‍රී ආහාරය ගැනීමට පහළට ගියෙමු. අත්තම්මාගේ පාන් සමඟ සුප් කෑම මේසය මත තබා තිබුණාය. ලයිකාද ඒ අසළම සිට නිදා ගෙන සිටියේය. ලයිකා යනු බල්ලෙක්ය. ඌ අපි දුටු පමණින්ම අඳුරගෙන නැට්ට වනන්නට විය. සීයා රූපවාහිනියේ විකාශනය වන වැඩසටහනක් බලමින් සිටියේය. ඉන්පසු අපි සියලු දෙනාම එකට හිඳ ආහාර ගත්තෙමු. සැමදෙනාගේම සුව දුක් විමසා අපිද සුවබර නින්දකට කාමරවලට ගියෙමු. රාත්‍රී දොළහේ වේලාව හඩ නගා වැදුණි. ඉන් ටික වේලාවකට පමණ පසු විශාල ශබ්දයක් සමඟ යමක ගැටෙන හඬද ඇසුණි. එය පළමුවරට ඇසුනේ මට හා ජැක්ටය. අපි අනිත් මිතුරන් දෙදෙනාටද මේ බව දැනුම් දුන්නෙමු. ඔවුන්ද නැගිට විවරව තිබූ ජනෙල් පියන් වලින් එළිය බැලූ විට කිසිම දෙයක් වත් වෙනසක් වත් පෙනෙන්නට නොතිබුණි. එම නිසාම අප සතරදෙනාම නැවතත් නිදන කාමර වෙත ගියේ මේ පිළිබඳව කුමක් හෝ දෙයක් පසුවදාට දැනගැනීමට හැකිවේයැයි බලාපොරොත්තුවෙනි.

ඊළඟ දිනයේ අපි උදෑසනම අවදි වුණෙමු. උදෑසන ආහාරය ලෙස අපි චොකලට් ගාපු රස පාන් පෙත්තක් හා කිරි වීදුරුවක් බඩට දාගත්තෙමු. අපි ඉන්පසු ඔරු පැදීමට ගඟට ගියෙමු. අපි ඔරුවට ගොඩ වන විටම තවත් ඔරුවක් අපේ ඔරුවට එහා පැත්තෙන් නැවැත්වන ලදී. එක්වරම ඒ දෙසින් ආවේ නාඳුනන පිරිමි කටහඬකි.

''ඔයාලා නැවතිලා ඉන්නේ ජෝර්ජ් මහත්මයාගේ ගෙදර නේද?'' ඔහු ඇසුවේය.

ජෝර්ජ් කියන්නේ අපේ සීයා නම තමයි. ඒත් මෙයා කොහොමද ඒ ගැන දන්නේ......

''හායි, මගේ නම ග්‍රේ. මම තමයි මේ ගමේ ලියුම් බෙදන්නේ. ඔයාලගේ සීයා ඊයේ හවස මට ඔයාලා එහෙ නැවතිලා ඉන්නවා කියලා කිව්වා. ''

''හඳුනා ගැනීම සතුටක්'' අපි සිනහවකින් සංග්‍රහ කළෙමු.

''ඉතින් ඉතින් ඔය ළමයි මොකද මෙහේ.? '' අපි මේ ඔරු පදින්න ආවා. ''අද අව්වත් හොඳට තියෙනවනේ. ''

''හොඳයි හොඳයි අපි එහෙනම් පස්සේ හම්බවෙමු කෝ'' කියා ඔහු එතැනින් සමුගත්තේය.

''මොනානැතත් ඒ මනුස්සයා නම් හරිම හොදයි.'' එසේ කීවේ ඇලෙක්ස්ය. අපි ඉන්පසු ඔරු පැදීමට ගියෙමු. තද අව්රැස් වලට ජලය දිලිසෙන අතර පිරිසිදුය. අපි ඔරුපදින අතරතුරේ අපට හම්බවුණේ දූපතක්ය. එය ඉතා කුඩා වුවත් ගස් වැල් වැවුණු අලංකාර දූපතකි. අපි ඔරුව ගැටගසා දූපතට ගොඩ වුණෙමු. සුදු වැලිකැටවලින් දූපතම පිරී ඇත. ඒ අව්රැස්වලට වැලි මුතු කැට මෙන් දිලිසෙයි. අපි එහි වටේ ඇවිද්දෙමු. ඇවිදින විට අපට හම්බවුණේ තද කළු පැහැති කුඩා ගුහාවකි. අපි එහි ඇතුළට ගියෙමු. අපි එනවිට විදුලි පන්දමක්වත් රැගෙන ආවේ නැති නිසා ගුහාව අංධකාරයෙන් අරක් ගෙන තිබුණි. මගේ සපත්තුව යම් දෙයක පැටලී මම බිම ඇද වැටුණි. බලනවිට එය ගසක මුලකි. එම මුල ගුහාවෙන් එළියට ආවකි.

''මට හිතෙනවා අපි හෙට රෑට ඇවිල්ලා මේ ගුහාව ඇතුල හොඳට බැලුවොත් හොඳයි කියලා''. ''ඔව්, ඒ වගේම අපි හෙට රෑ මේ ගුහාවේ රාත්‍රිය ගත කළොත් කොහොමද? අපිට හොඳ විනෝදයකුත් ගන්න පුළුවන් වෙයි.''

එසේ කීවේ පීටර්ය. ''හ්ම්.... ඒක නම් ඇත්ත'' අපිද ඊට පිළිතුරු දුන්නෙමු.

''මට නම් දැන් හොඳටම බඩගිනියි. අපි දැන් ගෙදර යමු නේ.'' එසේ කීවේ ජැක්ය. ''ඔව්, ඔව්, අපිටත් දැන් නම් බඩගිනියි.'' එසේ සිනාසෙමින් කියූ අපිද දූපතෙන් ගියෙමු. අපි නිවසට ගියෙමු. දිවා ආහාරය ගත්තෙමු. ''සීයේ අද අපිට ග්‍රේව හම්බුණා. අර ලියුම් බෙදන්නේ.'' මම කීවෙමි. ''කොහොමද, මනුස්සයාගේ නරකක් පේන්නත් නැනේ. මොකද ඉතින් කීව්වේ''? සීයා ඇසුවේය. ''විශේෂයක් නම් කිව්වේ නෑ, හැබැයි.''

''හා, හා ඔය මදෑ කතා කර කර හිටියා. දැන් ඇවිල්ලා කෑම කාලා ඉන්න. පස්සේ බරියෑ ඔය ගැන කතා කරන්න.'' අත්තම්මා එසේ කියා නැවතත් කුස්සියට ගියාය. අපි සියල්ලෝම එකට කෑම ගෙන උඩු මහළට ගියෙමු. ටික ටික රෑ බෝ විය. ''අදත් අපිට අර සද්දේ ඇහෙයිද දන්නෑ නේද.?'' එසේ කීවේ පීටර්ය. කෝකටත් කියලා අද අපි ඇහැරිලා ඉමු. අපිට මොකක් හරි දැනගන්න පුළුවන් වෙයිනේ.

එසේ කී අපි ටික වේලාවක් නිදාගෙන යළිත් රාත්‍රී 11.30ට පමණ අවදි වුණෙමු. අපි සතරදෙනාම එකම කාමරයට වී ජනේලයෙන් මුහුද දෙස බලා සිටින්නට වුණෙමු. විනාඩි දහයක් පමණ ගතවනවිට ඔරුවකින් කිසියම් මිනිසෙකු මුහුදේ ගමන් කරන ආකාරය අපට දැක ගන්නට හැකි විය. අවට කළුවර නිසා ඒ කවුරුන්දැයි කියා අපට හඳුනා ගන්නට නොහැකි විය. ඒත් සමගම තරමක් විශාල බෝට්ටුවක් මුහුදේ තව දිශාවකින් පැමිණියේය. අපි දිගටම බලන් සිටියෙමු. ඒ ඔරුව හා බෝට්ටුව යන දෙකම ගියේ අර අපි උදේ ගිය දූපත දෙසටය. එහි මිනිසුන් සතරදෙනෙකු පමණ සිටිනු අපට දැකගන්නට හැකි විය. ඔවුන් තරමක් විශාල බරපෙට්ටි වගයක් අර දූපතේ ගුහාව තුළට ගෙනියනු අපට පෙණිනි.

''ඇත්තටම මොකක්ද ඒ?'' එසේ ඇසූ ඇලෙක්ස් නැවතත් ඒ දෙසට නෙත් යොමු කළේය. ''අපි ඒක හෙට රෑට ගිහින් බලමු. මොකද කියන්නේ'' එසේ කියූ ජැක්ගේ තීරණයට අපිද එකග වුණෙමු.

තවත් විනාඩි අටක් පමණ ගතවිය. ඔවුහු ටික වේලාවක් එහි රැඳී සිට යන්නට ගියහ. ඔවුන් යනකල්ම අපි එහි සිට නෙත් යොමාගෙන සිටියෙමු. ඉන්පසු අපිද අපේ කාමරවලට ගොස් නිදාගැනීමට ගියේ සිතෙහි කුතුහලය මිශ්‍ර අභිරහසක්ද ඉතුරු කරමිනි.

ඉන්පසු දිනයද එළඹියේය. අපි උදේ සිටම අපට අවශ්‍ය යැයි සිතෙන සෑම දෙයක්ම සූදානම් කරගත්තෙමු. ''අත්තම්මේ, අපි අද රෑට අර දූපතට යනවා.''

''ඒ මොකටද? ''

''නිකමට වගේ. හැබැයි අපි ආය ගොඩක් රෑ වෙන්න කලින් එනවා.''

''ඔයාලා යන දිහාවක යන්න. හැබැයි පරිස්සමෙන් ගෙදර එන්න ඕනේ. තේරුණාද? ''

''හරි, අපි ඉක්මනට එනවා.''

එසේ කී අපි ගමනට සූදානම් වුණෙමු. කෝකටත් කියලා අපි කෝපි දාපු බෝතලයකුත් තව මස්පෙති දාපු පාන් වගයකුත්, බිස්කට් වගයකුත් අපේ ගමන් මල්ලට දාගත්තෙමු. ඒ අතර විදුලි පන්දමක්ද තව ලණු වගයක්ද තිබුණි.

අපි සවස 6.30ට පමණ නිවසින් පිටවී 7.00 වන විට දූපතට ළඟාවුණෙමු. අපි බෝට්ටුව රැගෙන පදුරු අස්සක හැංඟුවෙමු. බැරිවෙලාවත් අර මිනිස්සු අද රෑටත් ආවොත් එහෙම අපේ බෝට්ටුව තියෙනවා දැකලා කවුරුහරි ඇවිත් කියලා සැක හිතන්න පුළුවන්. ඒ හිංදා අපි බෝට්ටුව කාටත් නොපෙනෙන තැනක හැංඟුවෙමු. අපි ඉන්පසු අපි රැගෙන ආ විදුලි පන්දම්ද රැගෙන ගුහාව තුළට ඇතුළු වුණෙමු. විදුලි පන්දම් ආලෝකයට ගුහාව තුළ සිටි වවුල් රංචුවක්ද එළියට පියාඹගෙන ගියහ. අපි තව තවත් ඇතුළටම ගියෙමු. ඒ යන විට අපට ලී වලින් සෑදූ යම් බිත්තියක් වැනි දෙයක් දැක ගන්නට ලැබිණි. අපි ඒ අසළට ගොස් එය හොඳින් පරීක්ෂා කර බැලුවෙමු. බලව විට එය ලී වලින් සෑදූ විශාල දොරකි.

''සමහරක්විට මේක ඇතුළෙ වෙන්න පුළුවන් අපි ඊයේ රෑ දැක්ක පෙට්ටි ටික තියෙන්නේ.''

''ඔව්, මාත් හිතන්නේ එහෙම තමයි. ඒත් ඇත්තටම මොනවද ඒවගේ තියෙන්නේ.''

''සමහරක් විට වටිනා වස්තුවක් වෙන්නත් පුළුවන්''

‘‘ඔව්, එහෙම වුණොත් අපි මොකද කරන්නේ.’’ ‘‘මොනවා කරන්නද? පොලීසියට අල්ලලා දෙනවා මිසක් එතකොට පොලීසිය කරන දෙයක් කරයිනේ.’’ ‘‘ඒත් අපි කොහොමද මේක දැන් අරින්නේ.’’ ‘‘අනිවාර්යෙන්ම ඒ මිනිස්සු මේ දොර අරින යතුර කොහේ හරි හංගලා ඇති.’’ ‘‘අපි ටිකක් වටේ බැලුවොත් අපිට හොයා ගන්න බැරි වෙන එකක් නෑ.’’ එසේ කී ජැක් හා අපි සියලු දෙනාම යතුර සොයන්නට පටන් ගත්තෙමු. විනාඩි පහක් පමණ ගතවිය. ඉන් පසු මම ඒ අසළ තිබූ ගලකට විදුලි පන්දම එල්ල කළෙමි. ඒ අසළ වැලි වල යම් සංකේතයක් තිබෙනු මම දැක්කෙමි. එය කතිරයකි.

මම ඉන්පසු එතැනට ගොස් එම ගල උස්සා බැලුවෙමි. එය යට යම් දිලිසෙන දෙයක් පෙනෙන්නට විය. බලන විට එය යතුරකි. ‘‘මං හිතන්නේ මේක තමා ඔය දොරේ යතුර.’’ මම එසේ කියා මාගේ අනෙක් සඟයන්ටද යතුර පෙන්වූයෙමි.

‘‘අපි ඇරලා බලමු’’ යතුර දමන විට එහි දොර ඇරුණි. අපි ඇතුළට ගොස් බැලුවෙමු.

එය ඇත්තෙකි. අපි කියූ ලෙසින්ම එම පෙට්ටි එහි දක්නට ලැබුණි. එහි පෙට්ටි තුනක් පමණ දක්නට විය. අපි එයින් එකක් ඇර බැලුවෙමු. පුදුමයකි. එය රත්තරං කාසි හා මුතු මැණික් වලින් පිරී තිබුණි.

''මේ බලන්න''. මම මගේ විශ්මය පළ කළෙමි. ''එහෙනම් අපි හිතුවා හරි. මම හිතන විදිහට මේ ගොල්ලෝ මංකොල්ල කාරයෝ. අපි වහාම මේ ගැන පොලීසියට දැනුම් දෙන්න ඕනේ.''

''ඒ වගේම අපි මේ හොරු ටික අල්ලගෙන පොලීසියට භාරදුන්නොත් හොඳයි කියලයි මට නං හිතෙන්නේ?'' මම පැවසුවෙමි.

''දැන් අපි එළියට යමු. මට නම් දැන් බඩගින්නකුත් එනවා. සමහරක්විට අදරෑටත් අර හොරු ටික මේකට එන්න පුළුවන්. එපි එයාලා එනකං මෙතන රැකගෙන ඉමු. පස්සේ අපි හැංගිලා ඉදලා එයාලව අල්ලගමු.''

''ඒක නම් හොඳ අදහස. අපි දොර වසා යතුර තිබ්බ තැනම තබා ආපසු එළියට ආවෙමු. වේලාව බලන විට රාත්‍රී 8.00ට කිට්ටුය. අපි ඉන්පසු මස් දැමූ පාන්පෙති හා කෝපි කෝප්පයක් බී බඩගිනි නිවා ගත්තෙමු.

‘‘අපි මෙහෙම කරමු. අපි හතරදෙනෙක්ම මෙතන ඉන්න හින්දා අපි මාරුවෙන් මාරුවට මෙතන මුර කරමු. මමයි ජැක්යු පළවෙනි පැය දෙක මුර කරන්නම්. ඊට පස්සේ ඊළඟ පැය දෙක ඔයාලා මුර කරන්න.’’

එසේ කියා මම හා ජැක් පළවෙනි පැය දෙක මුර කිරීමට පටන් ගත්තෙමු. පැයක් පමණ ගත විය. ජැක්ට නින්ද යාගෙන එන විට මම ඔහුගේ කකුලට පයින් පාරක් ගැසුවෙමි.

තවත් පැය භාගයක් පමණ නිසොල්මනේම ගෙවී රාත්‍රී 10.00 උදා විය.

ඊළඟට මුර කරන්නේ ඇලෙක්ස් හා පීටර්ය. අපි ඔවුන් දෙදෙනාට මුර කිරීමට භාර දී අපි දෙදෙනා විවේක ගැනීමට ගියෙමු.

රාත්‍රී පරිසරය හරිම නිහඬය. අපට ඇසුණේ ගස්වැල් සුළඟට සෙලවෙන හඩ පමණි. පැය එකහමාරක් පමණ ගත විය. එකපාරටම යම් රළ හඬක් අපට ඇසුණි.කිසිවෙකු මේ පැත්තට එන බව දැණුනු නිසා පීටර් අප දෙදෙනාවද ඇහැරුවේය. අපේ සිතට යම් භයකුත් හට ගැණුනි.

අපි සියලු දෙනාම බිය වී තව තව ඒ හඬ දෙසට ඇහුම් කන් දුන්නෙමු. දැන් නම් ඒ හඬ පෙරට වඩා හොඳින්ම ඇසෙන්නට පටන් ගත්තේය. අපි සියලු දෙනාම ඉක්මනින්ම පඳුරක් අස්සට ගොස් හැංගී ඒ දෙස බලා සිටින්නට වුණෙමු. පෙර දින රාත්‍රියේ මෙන්ම ඒ බෝට්ටු දෙක දූපතට ළගා විය. අපි කිසිම හඩක් නොහැගෙන සේ ඒ දෙස බලා සිටින්නට වුණෙමු. ඔවුන්ගේ සපත්තු දූපතේ ඇති වැලිත් සමඟ ගැටෙන හඬද අපට ඇසෙන්නට විය. ඉන්පසු කළු ඡායාවක් ගුහාව අසළින් මතු වුණි. ටික වේලාවක් යනකල් එය හඳුනා ගැනීමට අපට නොහැකි විය. නමුත් හුරු පුරුදු හැඩරුවකි. බලන විට ඒ වෙන කිසිවෙකුත් නොවේ. ගමෙහි ලියුම්බෙදන්නා ශ්‍රේය. මට නම් මෙය අදහාගත නොහැකිය. නමුත් ඔහු මේ මැදියම් රැයෙහි මෙම දූපතේ කුමක්ද කරන්නේ. ඉන් පසු තව ඡායාවන් තුනක්ම පෙනෙන්නට විය. ඔවුන් නම් අප අඳුරන්නේ නැත. ඒ කියන්නේ ගමේ ලියුම් බෙදන්නත් මේ හොරකමට සම්බන්ධයි. ඉන් පසු ඔවුන් ගුහාව ඇතුළට ගියහ. ''අපි මේ ගැන ඉක්මනටම පොලීසියට කියන්න ඕනේ. නැත්තම් ලොකු විනාශයක් වෙන්න පුළුවන්''. ඇලෙක්ස් කීව්වේය.

‘‘ශ්..... සද්ද කරන්න එපා. එයාලා යනකල් අපි සද්ද කරන්න හොඳ නෑ. නැත්නම් ඔක්කොම ඉවරයි.’’ මම කිව්වෙමි.

විනාඩි දහයක් පමණ ගත වන විට ඔවුන් නැවතත් එළියට ආහ. ඔවුන් කිසියම් දෙයක් පිළිබඳව උනන්දුවෙන් කතා කරනු අපට ඇසිණි. අපි ඒ පිළිබඳ කන් යොමා අසා සිටියෙමු.

‘‘අපි ගොඩක් කල් මෙහෙ ඉන්න හොද නෑ, නැත්නම් අපි අහුවෙන්න පුළුවන්.’’ එක මිනිසෙක් කිව්වේය.

‘‘අපි හෙට රෑම මේ බඩු ටිකත් අරගෙන යමු. හෙට රෑ 8.30ට විතර අපි යමු.’’

එසේ කී ඔවුන් තව ටික වේලාවක් හිඳ පිටව යන්නට ගියහ.

ඔවුන් ගිය පසු අපි සැනසුම් සුසුමක් හෙළුවෙමු. ‘‘මට නම් හිතාගන්නවත් බෑ. ගමේ තැපැල්කාරයා මේ වගේ වැඩක් කරයි කියලා.’’ මම කිව්වෙමි. ‘‘ඒකනම් ඇත්ත. ඒත් අපිට හෙට රෑ විතරයි තියෙන්නේ මේ හොරු ටික අල්ලලා පොලීසියට භාරදෙන්න’’ ජැක් කිව්වේය.

''හෙට රෑ අපි 8.30ට කලින් මෙතනට එන්න ඕනේ. පොලීසියට කලින්ම දැනුම් දෙන්න ඕනේ.''

''හොඳයි දැන් රෑ 12.00ටත් කිට්ටුයිනේ. අපි දැන් ගෙදර යමු. ගෙදර ගොස් හෙට රෑ 8.30ට කලින් මෙතනට එමු.''

එසේ කී අපි නැවතත් නිවසට පැමිණියෙමු. මහන්සියටම අපට හොඳට නින්ද ගිය අතර අපි පසුදින උදෑසන අවදි වී අපේ සීයාට මේ පිළිබඳව කිව්වෙමු. සීයාද පුදුම වුණේය. සීයා පොලීසියට දැනුම් දෙන බව කිව්වේය. අපි හොරුන් ටික අල්ලා ගැනීමට අවශ්‍ය කරන සෑම දෙයක්ම සූදානම් කෙරුවෙමු. ඉන්පසු අපි සවස 7.00ට පමණ නිවසින් පිටවී දූපතට ළඟා වුණෙමු. අපි පැයභාගයක් පමණ සූදානමින් බලා සිටියෙමු.

''අපි හතරදෙනෙක් ඉන්න නිසා හොරු දෙන්නෙක්ව මම සහ ජැක් අල්ල ගත්තෙමු. අනිත් දෙන්නා ඔයාලා අල්ලගන්න'' මම කීවෙමි.

''මේ වැඩේ හරියයි නේද?'' පීටර් ඇසුවේය.

''මම තුනට ගණිනකොට අපි හතරදෙනාම එකපාර පැනලා හොරු ටික අල්ල ගමු.''

ඒත් සමඟම හොරු පැමිණියෝය. මම තුනට ගැණ්නෙමි. ඉන්පසු අපි සතරදෙනාම පැන හොරු ටික අල්ලා ඔවුන්ගේ කටවල් බැඳ ශරීර එකට තබා ගැට ගැසුවෙමු.

ඒත් සමඟම එතැනට පොලීසිය ආ අතර ඔවුන්ව අත්අඩංගුවට ගෙන රැගෙන ගියහ. අපේ මුහුනු වල ජයග්‍රාහී සිනාවක් ඇදුණි. මෙම වස්තුව බැංකුවකින් මංකොල්ල කෑ බව අපට පසුව දැනගන්නට ලැබුණි. එම වස්තුවද පොලීසිය භාරයට ගත් අතර අපි නිවෙසට ගොස් සතුට සැමරුවෙමි.

එම සතුටත් සමඟම අප තවදිනෙක එම දූපතේ රාත්‍රියක් ගත කිරීමට සිතා ගත්තෙමු.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහු විධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලික විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට

එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අතටකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාට වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිපිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිපිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**ISBN 978-624-208-648-4**

**රු.280.00**